දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපෑල, )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )


සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )FHB/GWH/2018/08
எனது இல )
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி )2018/03/16
Date )

# සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
# சுகாதார,போசணைமற்றும் சுதேசவைத்தியஅமைச்சு
# Ministry of Health, Nutrition& Indigenous Medicine

සියළුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
සියළුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්

**<u>නවක විවාපත් යුවල් සඳහා වන 'නව දිවි සුව සත්කාර සේවා' පැකේජය ලබාදීම සඳහා මාර්ගෝපදේශනය</u>**

ඔබ දැනටමත් දැනුවත් වී ඇති පරිදි පවුල් සෞඛ්‍ය කාර්යාංශය මගින් ඉහත සඳහන් පැකේජය පිළිබඳව මහජන සෞඛ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම සිදු කර ඇති අතර, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කණ්ඩායම විසින් මෙම සේවාව සියළුම නවක විවාපත් යුවල් වෙත ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

නව දිවි සුව සත්කාර පැකේජයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම, ශක්තිමත් කිරීම හා නියාමනය කිරීම සඳහා මාර්ගෝපදේශනයක් තිබීම අත්‍යවශ්‍ය වේ. එබැවින් මෙම පැකේජය ක්‍රියාත්මක කිරීම සඳහා පවුල් සෞඛ්‍ය කාර්යාංශය මගින් සකස් කර ඇති මාර්ගෝපදේශනය මේ සමග අමුණා ඇත.

නවක විවාපත් යුවල් සඳහා වන ඉහත සඳහන් සේවාවේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම සඳහා සියළුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්ය මණ්ඩලයට මෙම මර්ගොපදේශයට අනුගත වන ලෙසට උපදෙස් දෙන ලෙස මෙයින් කාරුණිකව දන්වා සිටිමි.

.................................

වෛද්‍ය අනිල් ජාසිංහ

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

පිටපත්:

ලේකම්, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, මහජන සෞඛ්‍ය සේවා II

අධ්‍යක්ෂ, මාතෘ සහ ළමා සෞඛ්‍ය, පවුල් සෞඛ්‍ය කාර්යාංශය

අධ්‍යක්ෂ, ජාතික සෞඛ්‍ය විද්‍යායතනය

ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, කොළඹ මහ නගර සභාව

පළාත් ප්‍රජා සෞඛ්‍ය විශේෂඥ වෛද්‍යවරුන්

මාතෘ සහ ළමා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරුන්

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරුන්

පොදු චක්‍ර ලේඛ ලිපි අංක : 02 - 68 /2018

**<u>නවක විවාපත් යුවල් සඳහා වන 'නව දිවි සුව සත්කාර සේවා' පැකේජය ලබාදීම සඳහා මාර්ගෝපදේශනය</u>**

මනාව සැකසුන මාතෘ හා ළමා සෞඛ්‍ය වැඩසටහනක් හරහා ප්‍රජාවට මාතෘ හා ළමා සෞඛ්‍ය සේවාවන් ලබා දීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව ආදර්ශ රටක් ලෙස සලකනු ලබයි. මෙම මාතෘ හා ළමා සෞඛ්‍ය වැඩසටහන සාක්ෂි මත පදනම්ව සැකසුනු මැදිහත්වීම් ඇතුලත් පැකේජ කීපයකින් සමන්විත වන අතර එමගින් මව්වරුන්ගේ හා ළදරුවන්ගේ සංකූලතා අවම කිරීමත් ඔවුන්ගේ සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීමත් බලාපොරොත්තු වේ.

මෙම වැඩසටහන මඟින් ආයතනික සෞඛ්‍ය සේවාවන් හා සෞඛ්‍ය ක්ෂේත්‍ර සේවාවන් අතර ශක්තිමත් බැඳීමක් ස්ථාපිත කර ඇති අතර ගර්භණීභාවය, දරු උපත, ළදරු අවධිය, ළමා අවධිය, නව යොවුන් විය හා වැඩිහිටි විය යන සියලු අවධි ආවරණය වන පරිදි අඛණ්ඩ සේවාවක් සහතික කර ඇත.මෙහි ප්‍රතිඵලයක් ලෙස මාතෘ, නව ජන්ම හා ළදරු මරණ වල සීඝ්‍ර අඩුවීමක් නිරීක්ෂණය වී ඇති අතර මෙමගින් ශ්‍රී ලංකාවේ මාතෘ හා ළමා සෞඛ්‍ය දර්ශක සංවර්ධිත රටවල තත්වයට සම තත්වයකට පත් වී ඇත.

කෙසේ නමුත්, පසුගිය කාලය තුල මෙම් දර්ශක වල ප්‍රගතිය මන්දගාමී ස්වරූපයක් ගැනීම හේතුවෙන් මාතෘ හා ළමා මරණ වලට හේතුවන සාධක පිලිබඳ ගැඹුරු විශ්ලේෂණයක් සිදු කිරීම අවශ්‍ය විය. මෙමගින් අනාවරණය වූයේ වර්තමානයේ මාතෘ මරණ සඳහා ප්‍රමුඛ හේතු ලෙස හදවත් රෝග, ස්වසන රෝග වැනි ගර්භනීභාවය හා සෘජුව සම්බන්ධ නොවූ රෝග තත්වයන් ඉදිරියට පැමිණ ඇති බවයි.තවද පෝෂණ ඌනතා, ගෘහස්ත හිංසනය වැනි සාධකද වැදගත් ආධාරක සාධක ලෙස ඉදිරියට පැමිණෙමින් පවතී.මෙම තත්ත්ව පිලිබඳ තව දුරටත් විශ්ලේෂණය කිරීමේදී පෙනී යන්නේ ඒවා දීර්ඝ කාලීනව පවතින, කාන්තාව ගර්භණී වීමට පෙර, පූර්ව ගර්භණී කාලයේදී හඳුනා ගෙන පාලනය කර ගත යුතු කල් පවතින තත්ත්ව බවය.

පූර්ව ගර්භණී සමයේදී මෙම තත්වයන් කල් තියා හඳුනා ගැනීම හා පාලනය කිරීම ගර්භණී සමයේ පමණක් නොව ඉන් පසුවද ඇති විය හැකි සංකූලතා මඟ හරවා ගැනීමට ඉවහල් වන අතර එමගින් තව දුරටත් අහිතකර මාතෘ හා ළමා ප්‍රතිඵල අවම කර ගත හැකි වේ.

මාතෘ හා ළමා සෞඛ්‍ය වැඩසටහන මගින් ගර්භණී සමයේ සිට නව යොවුන් විය දක්වා කාලය ආවරණය වන පරිදි සේවාව සැපයු නමුත් පූර්ව ගර්භණී සමයේදී සේවාව සැපයීමක් එමගින් සිදු නොවුනි. නමුත් ඉහත දැක්වූ කරුණු අනුව මෙම කාලය දක්වා සේවාව දීර්ඝ කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගත් පසු ගර්භණී වීමට ප්‍රථම සහකරුවන් දෙදෙනාගේම සෞඛ්‍ය තත්වය ප්‍රශස්ත කර ගැනීමේ අරමුණින් නව දිවි සුව සත්කාර සේවා පැකේජය නමින් නව වැඩසටහනක් හඳුන්වා දෙන ලදී. මෙම සේවා පැකේජය හරහා යුග දිවියට පිවිසෙත්දී සිත්හි ඇති වන සතුට හා බලාපොරොත්තු විවාහ දිවිය පුරාම නොනැසී පැවතීම සඳහා ශක්තිමත් අඩිතාලමක් දැමීමද බලාපොරොත්තු වේ. දරුවන් ඇතුළු මුළු පවුලේම යහපත් සෞඛ්‍ය තත්වය තහවුරු කිරීමටද හොඳ විවාහ දිවියක් හේතු වේ.

නව දිවි සුව සත්කාර සේවා පැකේජයේ අරමුණු:

- ප්‍රජනන සෞඛ්‍ය පිලිබඳ යුවලගේ දැනුම හා අවබෝධය වර්ධනය කිරීම සහ මත්පැන් සහ දුම්කොළ භාවිතය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය වැනි අහිතකර ජීවන රටාවන් අවම කිරීම හා ඒ තුලින් චර්යාත්මක වෙනසක් ඇති කිරීම.

- නව දිවි සුව සත්කාර සේවාව ලබා ගැනීමට යොමු කිරීම තුලින් සෑම කාන්තාවකගේම සෞඛ්‍ය තත්වය ගර්භණී වීමට පෙර උපරිම ලෙස වර්ධනය කර ගැනීම හා ආරක්ෂා කර ගැනීම.
- මව්පිය භාවය ලැබීමට පෙර විවාහක කාන්තාවගේ, පුරුශයාගේ හෝ නව යුවල සම්බන්ධ ගැටළු හඳුනා ගෙන, ඒවා නිවැරදි කිරීම හෝ අවම කිරීම.
- දරු ප්‍රසූතියේදී ඇති විය හැකි සංකූලතා අඩු කර ගැනීම මඟින් මවට/ දරුවාට ඇති විය හැකි අවදානම් තත්වයන් වළක්වා ගැනීම හෝ අවම කිරීම. ඒ තුලින් වලක්වා ගත හැකි මාතෘ මරණ හා ළදරු මරණ වලක්වා ගැනීම හෝ අවම කිරීම.

මෙම සේවා පැකේජය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, මහජන සෞඛ්‍ය හෙද සොයුරිය, මහජන සෞඛ්‍ය පරීක්ෂක සහ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණිය ඇතුළු සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කණ්ඩායම විසින් ලබා දිය යුතුයි.

### නව දිවි සුව සත්කාර සේවාවේ අඩංගු වන මෙවලම්

නව දිවි සුව සත්කාර සේවාවන් සැපයීම පහසු කිරීම සඳහා සෞඛ්‍ය කාර්ය මණ්ඩලයට මෙවලම් පහක් ලබා දී ඇත.

1. ආරාධනා පත්‍රය
2. නව දිවි සුව පිරික්සුම් පත
3. BMI කැල්ක්‍යුලේටරය
4. " සොඳුරු කැදැල්ලකට සුවහසක් සුබ පැතුම්" පොත
5. “නව දිවි සුව සත්කාර සේවාව සැලසීම පිණිස” සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සඳහා වූ මාර්ගෝපදේශ අත්පොත

➢ **ආරාධනා පත්‍රය**

යුවල විවාහ වන අවස්ථාවේ විවාහ රෙජිස්ට්‍රාර් තුමා/ තුමිය විසින් මෙම ආරාධනා පත්‍රය යුවල වෙත භාර දෙනු ලැබේ. මෙම වැඩසටහනේ ක්‍රියාකාරිත්වය මනාව සහතික කිරීම සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තුමා/ තුමිය විසින්, විවාහ රෙජිස්ට්‍රාර් වරුන් සමග වරින් වර සම්බන්ධීකරණය කළ යුතුයි. තම ප්‍රදේශයේ විවාහ රෙජිස්ට්‍රාර් වරුන් ළඟ ප්‍රමාණවත් තරම් ආරාධනා පත්‍ර ඇති බවට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තුමා/ තුමිය විසින් සහතික කර ගත යුතුයි.
යෝග්‍යතා පවුල් ලේඛණයට ඇතුලත් කර ගැනීම සඳහා නවක විවාපත් යුවල් හඳුනා ගැනීම, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියගේ වගකීමක් වන අතර ඒ සඳහා ආරාධනා පත්‍රය මඟින් ඔවුන් ඇය වෙත යොමු වීම බලාපොරොත්තු නොවිය යුතුයි. එම කාර්යය නව දිවි සුව සත්කාර සේවාව ප්‍රචලිත කර ගැනීමට ආධාරකයක් ලෙස පමණක් සැලකිය යුතුයි.

➢ **නව දිවි සුව පිරික්සුම් පත**

**මෙය ප්‍රශ්නාවලියකින් සමන්විත පිරික්සුම් පතක් වන අතර එහි පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තුමා/ තුමිය සහ නව යුවල විසින් පිරවීම සඳහා වෙන වෙනම කොටස් ඇත. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය විසින් නව යුවල යෝග්‍යතා පවුල් ලේඛණයේ ලියාපදිංචි කිරීමෙන් පසු, ඔවුන්ව මෙම වැඩසටහන පිළිබඳ දැනුවත් කර මෙම පිරික්සුම් පත ඔවුන් වෙත ලබා දිය යුතුයි.** දෙදෙනාම විසින් සාකච්ඡා කිරීමෙන් අනතුරුව එය සම්පූර්ණ කල යුතුයි. යුවලගේ ගැටළු හා අවදානම් තත්ත්ව හඳුනා ගැනීම පිණිස, මහජන සෞඛ්‍ය කාර්යය මණ්ඩලයට සම්පූර්ණ කරන ලද

මෙම පිරික්සුම් පත භාවිතා කල හැක. සෑම පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියක්ම තමා ලග ප්‍රමාණවත් තරම් පිරික්සුම් පත් තිබෙන බවට වග බලා ගත යුතුයි.

- **BMI කැල්ක්‍යුලේටරය**

  මෙම කැල්ක්‍යුලේටරය මඟින් දෙන ලද උසකට හා බරකට අදාළ BMI අගය ලබා දේ. ඊට අමතරව දෙන ලද BMI අගයකට අදාළ අර්ථකථනය වර්ණ ආධාරයෙන් පෙන්නුම් කර ඇත. නව දිවි සුව සත්කාර සැසි වලදී BMI අගය ගණනය කිරීම සඳහා මෙය උපයෝගී කර ගනී.

- **" සොඳුරු කැදැල්ලට සුවහසක් සුබ පැතුම්" පොත**

  මෙය නව යුවල සඳහා ලබා දෙන තොරතුරු අඩංගු පොත් පිංචකි. නව දිවි සුව සත්කාර සේවාව මඟින් පවත්වන සැසි දෙකම අවසන් වූ පසු මෙම පොත යුවල වෙත ලබා දිය යුතුයි. නැවත ලබා දෙන පදනම මත එය ලබා දිය යුතු අතර යුවල විසින් කියවා අවසන් කල පසු පොත නැවත ලබා ගැනීම සඳහා සෑම පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණියක් වෙතම ක්‍රමවේදයක් තිබිය යුතුයි. සෑම පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණියක් වෙතම පොත් 5ක් තිබිය යුතු අතර ඒ බවට අදාළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි විසින් සහතික කර ගත යුතුයි. තම දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය සේවකයන් සඳහා ප්‍රමාණවත් තරම් පොත් ඇති බවට මාතෘ හා ළමා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි විසින් සහතික කළ යුතුයි. ප්‍රමාණවත් තරම් පොත් නොමැති අවස්ථා වලදී පවුල් සෞඛ්‍ය කාර්යංශයට ඉල්ලීම් කිරීමෙන් ඒවා ලබා ගත හැක.

- **"නව දිවි සුව සත්කාර සේවාව සැලසීම පිණිස" සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සඳහා වූ මාර්ගෝපදේශ අත්පොත**

  මෙම සේවාව මඟින් සාකච්ඡාවට භාජනය කරන තේමාවන් පිළිබඳ සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ දැනුම යාවත් කාලීන කර ගැනීම සඳහා අවශ්‍ය වන තොරතුරු මෙම පොතේ අඩංගු වේ. නව දිවි සුව සත්කාර සේවාව සපයන සියලු කාර්යය මණ්ඩලය අතර මෙම පොත් බෙදා හරිය යුතුයි.

නව දිවි සුව සත්කාර සේවාව සැපයීමේ ක්‍රියා පිළිවෙල

**<u>නව දිවි සුව සත්කාර සේවාව සැපයීම සඳහා සේවා ලාභීන් හඳුනා ගැනීම.</u>**

නවක විවාපත් යුවල් සඳහා වන නව දිවි සුව සත්කාර සේවාවට පැමිණීම සඳහා නව යුවල් වෙත ලබා දෙන ආරාධනා පත්‍රය විවාහ රෙජිස්ට්‍රාර්වරුන් හරහා බෙදා හරිය යුතුයි. ක්ෂේත්‍ර මහජන සෞඛ්‍ය නිළධාරීන් (පවුල් සෞඛ්‍ය සේවා නිළධාරීන්/ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්) විසින් ඔවුන්ගේ ක්ෂේත්‍ර පිවිසුම් වලදී නව දිවි සුව සේවාව සඳහා සුදුසුකම් ලැබූ නව යුවල් හඳුනා ගත යුතු අතර ඔවුන්ව ලියාපදිංචි කිරීම සඳහා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය වෙත යොමු කළ යුතුයි.

**<u>පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණිය කාර්යාලයේදී/ ක්ෂේත්‍රයේදී සපයන සේවාව</u>**

පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණිය විසින් තම ප්‍රදේශයේ නවක විවා පත් යුවල් හඳුනා ගෙන යෝග්‍යතා පවුල් ලේඛනයේ (H 526) ඇතුලත් කර ගත යුතුයි.

එහි ඇතුලත් වූ පසු, නව දිවි සුව සත්කාර සේවාව පිලිබඳව යුවල දැනුවත් කර, නව දිවි සුව පිරික්සුම් පත ඔවුන් වෙත ලබා දිය යුතුයි. දෙදෙනා අතර සාකච්ඡාවෙන් පසු එය සම්පූර්ණ කිරීමටත්, සම්පූර්ණ කරන ලද පිරික්සුම් පත නැවත පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණිය වෙත ලබා දීමටත් ඔවුන්ට උපදෙස් ලබා දිය යුතුයි .

ලබා දෙන තොරතුරු වල රහස්‍ය භාවය සුරකින බවට ඔවුන්ට සහතිකයක් ලබා දීම වැදගත්ය.

සම්පූර්ණ කරන ලද පිරික්සුම් පත පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණිය විසින් ලබා ගත යුතු අතර එහි පහත සඳහන් ක්ෂේත්‍ර පිරික්සීම මගින් අවදානම් තත්ත්ව හෝ ගැටළු හඳුනා ගැනීමට කටයුතු කල යුතුයි.

- අතීත හා වර්තමාන සෞඛ්‍ය තත්වයන්, ලබා ගන්නා බෙහෙත් හා අවදානම් තත්ත්ව
- තෝරා ගත් සෞඛ්‍ය තත්ත්ව සම්බන්දයෙන් පවුල් ඉතිහාසය
- ප්‍රජනන සෞඛ්‍ය අවදානම් තත්ත්ව
- පෝෂණ තත්වය
- ජීවන රටාවේ ඇති අවදානම් තත්ත්ව
- අවට පරිසරයේ ඇති අවදානම් තත්ත්ව
- මානසික හා සමාජයීය අවදානම් තත්ත්ව (මානසික ආතතිය/ ප්‍රචණ්ඩත්වය)
- රුබෙල්ල එන්නත හා ෆොලික් අම්ල පෙති ලබා ගැනීම

පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණිය විසින් අවශ්‍ය අවස්ථා වලදී යුවලගෙන් තොරතුරු පැහැදිලි කර ගත යුතුයි.

හඳුනා ගත් අවදානම් තත්ත්ව පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය විසින් අදාළ තීරුවේ සලකුණු කල යුතුයි.

පළමු හා දෙවන නව දිවි සුව සත්කාර සැසි වලට සහභාගී වීම සඳහා, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ තබා ඇති සැසි පවත්වන දින ලේඛනයට අනුව, දෙදෙනාටම පැමිණිය හැකි ළඟම දින දෙකක් ලබා දිය යුතුයි.

මෙහිදී දෙදෙනාම සැසි දෙකටම සහභාගී වීමේ වැදගත් කම අවධාරණය කල යුතුයි.

| |
|---|
| සැමියා හා බිරිඳ දෙදෙනාම සැසි දෙකටම සහභාගී වීම අත්‍යවශ්‍ය වේ. |

**<u>නවක විවාපත් යුවල් සඳහා පවත්වන සැසි</u>**

මෙම පැකේජය සැසි දෙකක් හරහා ලබා දිය යුතුයි. අවම වශයෙන් එක මසකට එක සැසියක් හෝ පැවැත්විය යුතු අතර සැසි දෙක අනුගාමී මාස දෙකකදී පැවැත්විය යුතුයි.

(උදා: පළමු සැසිය - ජනවාරි
දෙවන සැසිය - පෙබරවාරි
පළමු සැසිය - මාර්තු
දෙවන සැසිය - අප්‍රේල් )

සැමියා හා බිරිඳ දෙදෙනාම සැසි දෙකටම සහභාගී විය යුතුයි.

කිසියම් යුවලකට එක සැසියක් මග හැරුණහොත් ඉන් පසු මාසයේදී නැවත එම සැසියට සහභාගී වන ලෙස ඔවුන්ට උපදෙස් ලබා දිය යුතුයි.
(උදා: ජනවාරි මස පැවැත්වුණු පළමු සැසිය මග හැරුණහොත් මාර්තු මාසයේ පැවෙත්වෙන එම සැසියටම සහභාගී වන ලෙස උපදෙස් ලබා දිය යුතුයි).

මෙම වසර තුල නව දිවි සුව සැසි පැවැත්වෙන දින පිලිබඳ විස්තරයක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ සහ සායන මධ්‍යස්ථාන වල ප්‍රදර්ශණය කර තිබිය යුතු අතර ඒ පිළිබඳව කාර්යය මණ්ඩලය දැනුවත් විය යුතුයි.

සායනයේදී යුවල වෙත පහත සේවාවන් ලබා දිය යුතුයි:

- සාර්ථක යුග දිවියක් ගත කරන ආකාරය පිලිබඳ දැනුවත් කිරීම හා සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීම.
- සැමියා හා බිරිඳ යන දෙදෙනාගේම සෞඛ්‍ය තත්වය නිර්ණය කිරීම.
- ගැටළු, රෝග තත්ත්ව හා අවදානම් තත්ත්ව හඳුනා ගැනීම.
- හඳුනා ගත් රෝග තත්ත්ව සඳහා අවශ්‍ය යොමු කිරීම් සිදු කිරීම.
- අවශ්‍ය අවස්ථා වලදී පවුල් සැලසුම් සේවාවන් ලබා දීම.
- සෞඛ්‍ය අධ්‍යාපනය ලබා දීම.

ඉතා වැදගත් මාතෘකාවන් 8ක් ඔස්සේ සෞඛ්‍ය අධ්‍යාපනය ලබා දිය යුතුයි (මෙම මාතෘකාවන් සේවා සපයන්නන්ගේ අත් පොතෙහි ඇතුලත්ව ඇත).

✓ පහත මාතෘකාවන් ඔස්සේ සෞඛ්‍ය අධ්‍යාපනය පළමු සැසියේදී ලබා දිය යුතුයි.

- නව දිවි සුව සත්කාර සේවාව පිළිබඳව හැඳින්වීම
- ලිංගිකත්වය හා ලිංගික ඇසුර
- ලිංගාශ්‍රිතව බෝ වන රෝග හා වගකීම් සහිත ලිංගික හැසිරීම
- සැලසුම් සහගත පවුලක් ඇති කර ගන්නා අයුරු

✓ පහත මාතෘකා ඔස්සේ සෞඛ්‍ය අධ්‍යාපනය දෙවන සැසියේදී ලබා දිය යුතුයි

- යහපත් පෝෂණය හා යහපත් සෞඛ්‍ය පුරුදු
- යහජීවන පැවැත්ම
- හිංසනයෙන් තොර පවුලක ප්‍රතිලාභ
- පුරුෂ සහභාගිත්වය හා මව්පියභාවය

✓ ලිංගිකත්වය, ලිංගික ඇසුර, ලිංගාශ්‍රිතව බෝ වන රෝග හා වගකීම් සහිත ලිංගික හැසිරීම වැනි මාතෘකා පිලිබඳ සාකච්ඡා කිරීමට සෞඛ්‍ය සේවකයන් මෙන්ම සහභාගිවන්නන්ද මැලිකමක් දැක්විය හැක. එබැවින් මෙම මාතෘකා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තුමා/ තුමිය විසින් ඉදිරිපත් කිරීම ලබා දෙන තොරතුරු වල විශ්වසනීයත්වය වැඩි වීමට හේතු වේ. තවද සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී

විසින් මෙම මාතෘකා ඉදිරිපත් කිරීමේදී, ඒ හා සම්බන්ධව තමාට ඇති ගැටළු ඉදිරිපත් කිරීමට සහභාගිවන්නන් වඩාත් ධෛර්යය මත් වීමට ඉඩ ඇත.

✓ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තුමා/ තුමිය විසින් නම් කරන ලද නිලධාරියෙකු විසින් අනෙකුත් මාතෘකා ඔස්සේ අධ්‍යාපනය ලබා දීම සිදු කළ හැක. අදාළ නිළධාරීන්ගේ හැකියාවන් මත පදනම්ව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තුමා/ තුමිය විසින් ඔවුන් තෝරා ගැනීම සිදු කළ හැකිය.

✓ සැනපත් කට්ටල, පරිගණක ඉදිරිපත් කිරීම් වැනි සෞඛ්‍ය අධ්‍යාපනය ලබා දීමට භාවිතා කරන උපකරණ සාදා ගැනීම සිදු කල හැක.

✓ සෞඛ්‍ය අධ්‍යාපන සැසි මෙහෙයවීමේදී කරනු ලබන සියලුම මාතෘකා පිළිබඳ තොරතුරු හා දැනුම "නව දිවි යුව සත්කාර සේවාව සැලසීම පිණිස" සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සඳහා වූ මාර්ගෝපදේශ අත්පොතෙහි අඩංගු වන අතර, සෞඛ්‍ය අධ්‍යාපන සැසි සඳහා සහභාගී වන සියලුම මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය මෙම අත්පොතෙහි සියළුම පරිච්ඡේද හොඳින් කියවිය යුතුයි.

සෞඛ්‍ය අධ්‍යාපන සැසි හැරුන විට අනෙකුත් සේවාවන් (BMI අගය ගණනය කිරීම, යුවල පරීක්ෂා කිරීම, රුධිර හා මුත්‍රා පරීක්ෂාවන් වැනි) කාර්ය මණ්ඩලයට පහසු අයුරින් පළමු හෝ දෙවෙනි සැසියේදී සිදු කල හැක.

දෙවන සැසිය සඳහා සහභාගී වීමේ අඩු වීමක් ඇති විය හැකි බැවින් එම සැසියේ ආකර්ෂණීයතාවය වැඩි කර, සැසි දෙකටම සියලු දෙනාම සහභාගී වීම තහවුරු කර ගැනීම සඳහා අදාළ උපාය මාර්ගයන් භාවිතා කල යුතුයි.
(උදා: දෙවන සැසිය සඳහා සහභාගීත්වය තහවුරු කර ගැනීම සඳහා රුධිර පරීක්ෂණ එම සැසියේදී සිදු කල හැක. තවද දෙවන සැසියට සහභාගී වීමේ වැදගත්කම ඔවුන්ට වටහා දිය යුතුයි.)

| |
|---|
| නවක විවාපත් යුවල් සඳහා සේවාවන් සැපයීම සඳහා සැසි දෙකක් පැවැත්වීම අනිවාර්ය වේ |

## සායනික සැසියේදී ලබා දෙන අනෙකුත් සේවාවන්

සායනයේදී, යුවල සායනික පැමිණීමේ ලේඛනයට ඇතුලත් කර ගත යුතුයි. ඉන්පසුව ඔවුන් විසින් සම්පූර්ණ කරන ලද සහ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය විසින් තක්සේරු කරන ලද නව දිවි සුව පිරික්සුම් පත සමග සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තුමා/ තුමිය වෙත යොමු කල යුතුයි.

නව යුවල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තුමා/ තුමිය වෙත යොමු කිරීමට ප්‍රථම පහත සේවාවන් ලබා දිය යුතුයි.

- උස හා බර මැනීම හා BMI කැල්කියුලේටරය භාවිතයෙන් BMI අගය ගණනය කිරීම. BMI ප්‍රතිඵල වලට අනුකූලව අදාළ උපදෙස් ලබා දීම.
- මූලික පරීක්ෂණ - දෙදෙනාගේම රුධිරයේ සීනි ප්‍රමාණය හා හිමොග්ලොබින් ප්‍රමාණය බැලීම සිදු කල යුතුයි. මීට අමතරව පහසුකම් තිබේ නම් රුධිර ඝනය සහ Rh සාධකය බැලීම, VDRL පරීක්ෂණය ආදී පරීක්ෂණද සිදු කල හැක.

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තුමා/ තුමිය විසින් පිරික්සුම් පතේ ඇති තොරතුරු හා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණිය විසින් පුරවා ඇති අවදානම් සාධක තීරුව පරීක්ෂා කර, අදාළ යුවල සම්බන්ධයෙන් ඇති අවධානම් සාධක හා අනෙකුත් ගැටළු හඳුනා ගත යුතුයි.

නව දිවි සුව පිරික්සුම් පතෙහි ලබා දී ඇති තොරතුරු සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තුමා විසින් පැහැදිළි කර ගත යුතු අතර, අවශ්‍ය නම්, ඔහු / ඇය විසින් වැඩි විස්තර ලබා ගත යුතුයි.

දෙදෙනාම සඳහා රුධිර සංසරණ පද්ධතිය, ශ්වසන පද්ධතිය, ස්නායු පද්ධතිය සහ රුධිර පීඩනය ඇතුළු මූලික වෛද්‍ය පරීක්ෂාවක් සිදු කිරීම සහ කාන්තාව සඳහා පියයුරු පරීක්ෂණයක් සිදු කිරීම.

නව යුවලගේ වෛද්‍ය ඉතිහාසය විමසීමෙන්, ඔවුන් දෙපළ පරීක්ෂා කිරීමෙන් සහ අදාළ මූලික පරීක්ෂණ සිදු කිරීම මගින් නව යුවල සම්බන්ධව අවදානම් සහගත තත්වයන්, රෝග සහ ගැටළු හඳුනා ගත යුතුයි.

හඳුනා ගත් රෝග, ගැටළු හා අවදානම් තත්ත්ව සඳහා අදාළ මැදිහත් වීම් සිදු කිරීම (උපදේශනය, ප්‍රතිකාර කිරීම හෝ අවශ්‍ය විට වැඩිදුර පරීක්ෂණ හෝ විශේෂඥ සේවාවන් සඳහා යොමු කිරීම).

අවශ්‍ය අවස්ථාවන් වලදී සුදුසු පවුල් සැලසුම් සේවාවන් සහ උපදේශනය ලබා දීම.

**සායනික සැසිය අවසානයේදී:**

නව දිවි සුව පිරික්සුම් පත නැවත යුවල වෙත ලබා දිය යුතුයි.

මෙම පිරික්සුම් පත ප්‍රථම පූර්ව ප්‍රසව සායනයේදී නැවත පිරික්සන බැවින් එය සුරැකිව තබා ගන්නා ලෙස උපදෙස් ලබා දියයුතුයි. තවද වෛද්‍ය ප්‍රතිකාර සඳහා යන සෑම අවස්ථාවකදීම මෙය රැගෙන යා යුතු බවද පහදා දිය යුතුයි.

යුවල නැවත පරීක්ෂා කිරීමට අවශ්‍ය නම් එය ඔවුන්ට දැනුම් දිය යුතු අතර ඒ සඳහා දිනයක්ද ලබා දිය යුතුයි.

යුවලගේ සෞඛ්‍ය හා යහ පැවැත්ම සම්බන්ධ වැදගත් තොරතුරු සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් අදාළ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණියට දැනුම් දිය යුතු අතර ඔවුන් සඳහා පසු ගමන් කිරීමේ වැදගත් කමද පහදා දිය යුතුයි.

දෙවන සැසිය අවසානයේ "සොඳුරු කැදැල්ලට සුවහසක් සුබ පැතුම්" පොත නිවසට ගෙන ගොස් කියවීම සඳහා යුවල වෙත ලබා දිය යුතුයි.

| |
|---|
| වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා යන ඕනෑම අවස්ථාවකදී නව දිවි සුව පිරික්සුම් පත රැගෙන යන ලෙසට යුවලට උපදෙස් ලබා දිය යුතුයි |

## නව දිවි සුව සත්කාර සේවාව සපයන කාර්යය මණ්ඩලයේ කාර්යයන් හා වගකීම්

### පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණියගේ කාර්යයන්

**ක්ෂේත්‍රයේදී**

- නවක විවාපත් යුවල් හඳුනාගැනීම හා ඔවුන් යෝග්‍යතා පවුල් ලේඛනයට ඇතුලත් කර ගැනීම.
- නව දිවි සුව සත්කාර සේවාව පිලිබඳ නව යුවල් දැනුවත් කිරීම.
- නව දිවි සුව පිරික්සුම් පත යුවලට ලබා දී එය සම්පූර්ණ කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දීම.
- සම්පූර්ණ කරන ලද පිරික්සුම් පත පරීක්ෂා කර යුවලගේ ගැටළු හා අවදානම් තත්ත්ව හඳුනා ගැනීම.
- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ/ සායනයේ පැවැත්වෙන පළමු හා දෙවන සැසි වලට සහභාගී වීම සඳහා යුවලට දිනයන් හා වේලාවන් ලබා දීම.
- අඛණ්ඩ රැකවරණයක් අවශ්‍ය වන යුවල් සඳහා පසු විපරම් සිදු කිරීම.
- නව යුවල් සමග සුහද සම්බන්ධතාවයක් පවත්වා ගැනීම සහ ලබා ගත හැකි සේවාවන් පිලිබඳව ඔවුන් දැනුවත් කර අවශ්‍ය විට තමා සමග සම්බන්ධ විය හැකි ආකාරය පිලිබඳව දැනුවත් කිරීම.
- නව දිවි සුව සත්කාර සේවාව පිලිබඳව සහ සේවාව ලබා ගන්නා ආකාරය පිලිබඳව ප්‍රජාව දැනුවත් කිරීම.
- නව යුවල විසින් සපයන ලද තොරතුරු වල රහස්‍ය භාවය ආරක්ෂා කිරීම.

**සැසියේදී**

- යුවල සැසියේ නාම ලේඛනයේ ලියාපදිංචි කර ගැනීම.
- සැමියාගේ හා බිරිඳගේ උස හා බර මැනීම, හා BMI කැල්කියුලේටරය ආධාරයෙන් BMI අගය ගණනය කිරීම.
- BMI අගය මත පදනම්ව උසට සරිලන නිසි බරක් පවත්වා ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීම.
- රුබෙල්ලා එන්නත ලබා නොගත් කාන්තාවන් සඳහා MMR එන්නත ලබා දීම.
- රුධිරයේ ග්ලූකෝස් මට්ටම හා හිමග්ලොබින් මට්ටම පරීක්ෂා කිරීම (තීරු භාවිතයෙන්).
- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තුමා/ තුමිය ගේ අධීක්ෂණය යටතේ, නව යුවල් සඳහා යහපත් චර්යාත්මක වෙනසක් ඇති කර සාර්ථක යුග දිවියක් ගත කිරීමට උපකාරී වන පරිද්දෙන් සෞඛ්‍ය අධ්‍යාපනය ලබා දීම.
- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තුමාගේ/ තුමියගේ නිර්දේශය මත පවුල් සැලසුම් උපදේශනය සහ සේවා සැපයීම.
- නව යුවලට ඔවුන්ගේ ගරුත්වය ආරක්ෂා වන පරිදි කටයුතු කිරීම සහ ඔවුන්ගේ තොරතුරු වල රහස්‍ය භාවය ආරක්ෂා කිරීම.

### මහජන සෞඛ්‍ය පරීක්ෂක තුමාගේ කාර්යයන්

- තම ප්‍රදේශයේ නවක විවාපත් යුවල් හඳුනා ගැනීමටත්, නව දිවි සුව සත්කාර සේවාව පිළිබඳව ඔවුන් දැනුවත් කිරීමටත්, සැසි සඳහා සහභාගී වීමට ඔවුන් දිරිමත් කිරීමටත් මහජන සෞඛ්‍ය පරීක්ෂක තුමා, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණියට සහය විය යුතුයි.

සායනයේදී ඔහු විසින් පහත කටයුතු සිදු කල යුතුයි:

- සැසියේ කටයුතු සූදානම් කිරීමට හා පවත්වා ගෙන යාමට මහජන සෞඛ්‍ය කාර්ය මණ්ඩලයට සහය වීම
- සහභාගී වන යුවල දැනුවත් කිරීම සඳහා සෞඛ්‍ය අධ්‍යාපනය ලබා දීම.

**<u>මහජන සෞඛ්‍ය හෙද සොයුරියගේ කාර්යයන්</u>**

නවක විවාපත් යුවල සඳහා සැසි සැලසුම් කිරීමට සෞඛ්‍ය කාර්යය මණ්ඩලයට ඇය ආධාර කල යුතුයි. මීට අමතරව ඇය විසින් පහත කාර්යයන් සිදු කල යුතුයි:

- කාර්යක්ෂම ලෙස සැසිය පවත්වා ගෙන යාමට අවශ්‍ය මග පෙන්වීම ලබා දීම.
- රුධිර සීනි ප්‍රමාණය සහ හිමොග්ලොබින් ප්‍රමාණය යන මූලික රුධිර පරීක්ෂණ සිදු කිරීම අධීක්ෂණය කිරීම
- රුධිර ඝනය පරීක්ෂා කිරීම, VDRL පරීක්ෂාව වැනි පරීක්ෂණ සඳහා රුධිරය ලබා ගැනීම.
- සැසියේ කටයුතු අධීක්ෂණය කිරීම.
- තම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ප්‍රදේශයේ සැසි සඳහා අවශ්‍ය වන, නව දිවි සුව පිරික්සුම් පත්, පොත්, ආරාධනා පත්‍ර, BMI කැල්ක්‍යුලේටරය සහ අනෙකුත් අදාළ ද්‍රව්‍ය අඛණ්ඩව හා අවශ්‍ය ප්‍රමාණ වලින් පවත්වා ගැනීම.
- සේවාස්ථ පුහුණු වැඩසටහන් වලදී/ මාසික රැස්වීම් වලදී, නව දිවි සුව සත්කාර සේවාව පිළිබඳ නව සංකල්ප, චක්‍රලේඛ, මාර්ගෝපදේශ පිළිබඳව සෞඛ්‍ය කාර්යය මණ්ඩලය දැනුවත් කිරීම.
- සැසියේදී සහභාගී වන යුවලගේ දැනුම හා අවබෝධය දියුණු කිරීම.

**<u>සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීගේ කාර්යයන්</u>**

නවක විවාපත් යුවල සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේදී/ ක්ෂේත්‍ර සායන මධ්‍යස්ථාන වලදී නව දිවි සුව සැසියන් පවත්වා ගෙන යාම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීගේ වගකීමකි.

සැසියේදී පහත කටයුතු ඔහු/ ඇය විසින් සිදු කල යුතුයි:

- සම්පූර්ණ කරන ලද පිරික්සුම් පත පරීක්ෂා කිරීම මගින් නවක විවාපත් යුවල ගේ අවදානම් තත්ත්ව හා ගැටළු හඳුනා ගැනීම.
- හඳුනා ගත් ගැටළු විසඳා ගැනීම සඳහා අවශ්‍ය මග පෙන්වීම.
- සැසියට පැමිණෙන නවක විවාපත් යුවල සඳහා (සැමියා හා බිරිඳ දෙදෙනාටම) වෛද්‍ය පරීක්ෂාවක් සිදු කිරීම.
- හඳුනා ගත් ගැටළු සඳහා අවශ්‍ය පරිදි ප්‍රතිකාර/ උපදෙස්/ උපදේශනය ලබා දීම.
- අවශ්‍ය විට විශේෂඥ වෛද්‍ය සේවාවන් සඳහා යොමු කිරීම.
- පළමු සැසියේදී වැදගත් මාතෘකා කීපයක් ඔස්සේ සෞඛ්‍ය අධ්‍යාපනය ලබා දීම: ලිංගිකත්වය හා ලිංගික ඇසුර, ලිංගාශ්‍රිතව බෝ වන රෝග, වගකීම් සහගත ලිංගික හැසිරීම.
- නව දිවි සුව පිරික්සුම් පත්, පොත්, ආරාධනා පත්‍ර, BMI කැල්ක්‍යුලේටරය සහ අනෙකුත් අදාළ ද්‍රව්‍ය අඛණ්ඩව හා අවශ්‍ය ප්‍රමාණ වලින් පවත්වා ගැනීම.

- සේවාස්ථ පුහුණු වැඩසටහන් වලදී/ මාසික රැස්වීම් වලදී, නව දිවි සුව සත්කාර සේවාව පිළිබඳ නව සංකල්ප, චක්‍රලේඛ, මාර්ගෝපදේශ පිළිබඳව සෞඛ්‍ය කාර්යය මණ්ඩලය දැනුවත් කිරීම.
- ගැටළු ඇති බවට හඳුනා ගත් යුවල පිළිබඳ පසු විපරම් කිරීම.
- සැසියේ සමස්ථ අධීක්ෂණය, සැසිය පවත්වා ගෙන යාම හා සම්බන්ධීකරණය කිරීම.

**නව දිවි සුව සත්කාර සේවාව සම්බන්ධ RHMIS**

2018 වර්ෂයේදී නව දිවි සුව සත්කාර සේවාව සඳහා මුද්‍රිත සායනික පැමිණීමේ ලේඛනයක් ලබා දෙනු ලැබේ. සැමියා සහ බිරිඳ පිළිබඳ දත්ත සෞඛ්‍ය කාර්යය මණ්ඩලය විසින් සැසි අතරතුර මෙම ලේඛනයේ ඇතුලත් කල යුතුයි.

මෙම දත්ත වල සාරාංශයක් ත්‍රෛමාසික මාතෘ හා ළමා සෞඛ්‍ය සායනික වාර්තාවේ (RH MIS 527) ඇතුලත් කල යුතුයි. එම දත්ත වලට අදාළ ඉඩ 2018 වර්ෂයේ සිට RH MIS 527හි ඇතුලත් කරනු ලැබේ.

1. **මෙම සේවාව හරහා සේවාවන් ලද නවක විවාපත් යුවල ප්‍රතිශතය ගණනය කරන අයුරු:**

සැසි සඳහා සහභාගී වූ යුවල ගණනින් භාගයක් ගණනය කර (RH-MIS 527 හි සඳහන් පරිදි) එය එම වසර තුලදී පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණියන් විසින් යෝග්‍යතා පවුල් ලේඛනයේ ඇතුලත් කර ඇති නව යුවල ප්‍රමාණයෙන් බෙදිය යුතුයි (RH MIS 509) x 100%
(එක් යුවලක් සැසි දෙකකට සහභාගී විය යුතු බැවින්, සහභාගී වූ මුළු යුවල් ගණන දෙකෙන් බෙදනු ලැබේ).

$$\frac{\text{මෙම වසර තුල සැසි සඳහා සසභාගී වූ යුවල ගණන / 2}}{\text{එම වසර තුලදී පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණියන් විසින් යෝග්‍යතා පවුල් ලේඛනයේ ඇතුලත් කර ඇති නව යුවල ප්‍රමාණය}} \times 100\%$$

2. සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවේ එක් වසරකදී විවාහ වන ප්‍රතිශතය මුළු ජනගහනයෙන් 1% ක් පමණ වේ. එබැවින්, මෙම නව දිවි සුව සත්කාර සේවාවන් ලබා ගත යුතු යුවල් සංඛ්‍යාව මුළු ජනගහනයෙන් 1 % ක් පමණ වේ.

.................................

වෛද්‍ය අනිල් ජාසිංහ

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.